www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද උප ජනාධිපති බිඩෙන් යුක්‍රේනයේ හා ජෝර්ජියාවේ සංචාරයක යෙදෙයි

## US vice president Biden visits Ukraine and Georgia

**නියාල් ග්‍රීන් විසිනි**

**2009 ජුලි 23**

සතිය මුල දී යුක්‍රේනයේ සංචාරයක යෙදීමෙන් අනතුරුව, එක්සත් ජනපද උප ජනාධිපති ජෝ බිඩෙන් ජුලි 22 දින කලින් පැවති ජෝර්ජියානු සෝවියට් සමූහාන්ඩුව වෙත පැමිනියේ ය. මේ සංචාරය යෙදෙන්නේ පසුගිය මස මොස්කව් නගරයෙහි පැවති ජනාධිපති ඔබාමාගේ නායක සමුලුවෙන් අනතුරුව ය. යම් යම් මූලෝපායික ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් සහයෝගිතාවයෙන් ක්‍රියා කිරීම සඳහා ඇමරිකානු සහ රුසියානු නායකයෝ එම සමුලුව තුල යත්න දැරූහ.

ඇෆ්ගනිස්තානයෙහි හා උතුරු පකිස්තානයෙහි එක්සත් ජනපද නායකත්වයෙන් ගෙනයන යුද්ධවලට පලකරන ලද රුසියානු සහායට ප්‍රතිචාරයක් වශයෙන්, එක් ජ්‍යෙෂ්ට ක්‍රෙම්ලින් නිලධාරියෙකුට අනුව, ජෝර්ජියාව හා යුක්‍රේනය සමග මොස්කව්හි සබඳතාවල ''විශේෂතා'' පිලිගැනීමට ඔබාමා ඉදිරිපත් විය.

මේ රටවල් දෙකෙහි බිඩෙන්ගේ සංචාරය පුලුල් ලෙස දිස්වනුයේ එක්සත් ජනපදයට පක්ෂපාතී මෙම ආන්ඩු සතුටු කිරීමේ උත්සාහයක් ලෙස ය. එම ආන්ඩු බලයට පත් කරන ලද්දේ ඇමරිකානු අරමුදල් යොදවන ලද ''වර්න විප්ලව'' තුලිනි. තවද, බිඩෙන් සංචාරය දිස්වනුයේ මෑත දී මොස්කව් වෙත ලබා දුන් සීමිත සහන තිබියදී වුව ද, කලින් සෝවියට් ආධිපත්‍ය යටතෙහි පැවති ප්‍රදේශය සම්බන්ධයෙන් වොෂිංටනයට තව දුරටත් බලගතු ආසක්තයන් පවතින බවටඒ වෙත කරන ලද අනතුරු ඇඟවීමක් ලෙස ය.

ජනාධිපති වික්ටර් යුෂ්චෙන්කෝ සමග සාකච්ඡා පැවැත්වීම සඳහා ඔහු අඟහරුවාදා යුක්‍රේන අගනුවර වන කියෙව් නගරයට පැමිනියේ ය. රුසියාව හා එක්සත් ජනපදය අතර සබඳතා, උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයට (නේටෝ) බැඳීමේ යුක්‍රේනියානු සැලසුම්වලට බලපෑමක් ඇති නොකරන බවට ර ස්වීමෙන් අනතුරුව පැවැත්වූ දේශනයක දී බිඩෙන් කියා සිටියේ ය. බිඩෙන්ගේ අදහස ක්‍රෙම්ලිනයෙහි විරෝධයට ලක් නොවන පරිදි පැටලිලි සහගතව ඉදිරිපත් කල එම වදන් සකසන ලද්දේ එක්සත් ජනපද නායකත්වයෙන් යුතු මිලිටරි සංධානයෙහි අනාගත යුක්‍රේනියානු සාමාජිකත්වයට දොර විවෘතව තැබීමට ඉඩ තබමිනි.

''යුරෝ-අත්ලාන්තික් ඒකාබද්ධ වීමෙහි කොටස්කරුවෙකු වීමට ඔබ කැමතිවන්නේ නම් - එසේ වෙතැයි මම විශ්වාස කරමි - අපි එයට බලගතු ලෙස සහාය දක්වමු'' යයි බිඩෙන් පැවසීය. ''බලපෑම් ඇති ප්‍රදේශ - මෙය නැවත නැවතත් අවධාරනය කරනු කැමැත්තෙමි - අපි පිලිනොගනිමු'' යයි බිඩෙන් තව දුරටත් පැවසීය. ''ඔබ හෝ වෙනත් ඕනෑම රටක් කුමන සන්ධානයකට ඇතුලුවන්නේ ද නැතහොත් කුමන සම්බන්ධතාවක් පවත්වාගත යුතු ද යන්න ඔබට අනකිරීමට කිසිවකුටත් ඇති අයිතිය අපි පිලිනොගන්නෙමු.''

ප්‍රසිද්ධියේ එවැනි උනුසුම් වදන් පැවසුව ද, යුක්‍රේනය නේටෝ සංවිධානයට ඇතුලුකිරීම සඳහා ඉඩ දීම සලකා බැලීමට පෙරාතුව, යුක්‍රේනයට ''බොහෝ දුර ගමන් යා යුතුව තිබෙන බවට'' උප ජනාධිපති සමග සංචාරයෙහි යෙදුනු නම් සඳහන් නොකරන ලද එක්සත් ජනපද නිලධාරීහු පුවත්පත්වලට පැවසූහ.

යුක්‍රේනය නේටෝ සංවිධානයෙහි සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ජනාධිපති යුෂ්චෙන්කෝ කැපවී සිටී. මොස්කව් තන්ත්‍රය මේ පියවරට දැඩි ලෙස විරෝධය පායි. යුක්‍රේනයෙහි ජනමත විමසුම් පෙන්නුම් කරනුයේ ජනගහනයෙන් අති බහුතරය යුක්‍රේනය මේ සන්ධානයෙහි සාමාජිකත්වය දැරීමට විරෝධය පාන බවය.

යුක්‍රේනියානු ඛනිජ තෙල් හා ගෑස් නල මාර්ග ජාලයෙහි එක්සත් ජනපදය ආයෝජනය කල යුතු බවට ද බිඩෙන් යෝජනා කලේ ය. රුසියාවෙන් බටහිර යුරෝපයට සැපයෙන බල ශක්ති ප්‍රමානයෙන් ඉතා වැඩි කොටසක් ගලා යන්නේ මේ නල මාර්ගය තුලිනි. ගෙවීම් සහ මිල ගනන් සම්බන්ධයෙන් රුසියාව හා යුක්‍රේනය අතර වසරේ ජනවාරියෙහි දී පැන නැගුනු ආරවුලක් හේතු කොට ගෙන යුරෝපයෙන් ඉතා වැඩි

කොටසකට ස්වාභාවික ගෑස් නොමැතිව ගත කිරීමට සිදු විය. යුක්‍රේනය හරහා ඛනිජ තෙල් හා ගෑස් ගෙනයාම අතිශය ලාභදායී ව්‍යාපාරයක් වුවද නල මාර්ග යටිතල පහසුකම් අලුත්වැඩියා කල යුතුව ඇත. මොස්කව් හා කියෙව් අතර අයහපත් දේශපාලන සබඳතා පවතින තත්ත්වයක් තුල රුසියාවෙහි රාජ්‍ය ගෑස් සමාගම වන ගෑස්ප්‍රොම් සමාගමෙහි අභිලාෂයන්ට අවාසිවන පරිදි එක්සත් ජනපද බලශක්ති සමාගම්වලට රට තුලට කඩා වැදීමට ඉඩ සැලසී ඇත.

ඉන් පසුව ජුලි 21 දින බිඩෙන් යුක්‍රේනියානු අගමැති යුලියා ටිමොෂෙන්කෝ හමුවිය. ''තැඹිලි විප්ලවය'' සමය තුල ටිමොෂෙන්කෝ යුෂ්චෙන්කෝගේ මිත්‍රයෙකු විය. දැන් දෙදෙනා දැඩි සතුරන් වේ. ඒකාධිපතිවාදී තන්ත්‍රයක් ස්ථාපිත කිරීම සඳහා කුමන්ත්‍රනය කිරීම පිලිබඳව පසුගිය මාසවල දී මේ නායකයින් දෙදෙනා එකිනෙකාට චෝදනා නගාගත්හ. ලබන වසරේ යෝජිත ජනාධිපති මැතිවරනයට ඉදිරිපත්වන ටිමොෂෙන්කෝ ජනප්‍රියත්යෙන් අඩු යුෂ්චෙන්කෝ පරාජයට පත් කිරීමට ඉඩ ඇත.

බිඩෙන්, වික්ටර් යනුකොවිච් ද හමුවිය. අරෝවට ලක්වුනු 2004 වසරේ මැතිවරනයෙහි දී පරාජිත අපේක්ෂකයා වනුයේ ඔහු ය. බලගතු නැගෙනහිර යුක්‍රේනියානු කතිපයාධිකරනයේ අනුග්‍රහය ලබා ඇති යනුකොවිච් 2010 වසරෙහිදී පැවැත්වෙන ජනාධිපතිවරනය සඳහා නැවත වරක් ඉදිරිපත්වීමට නියමිත ය. රුසියාව සමග සමීප සබඳතා පවත්වාගෙන යෑමට කැමැත්ත දක්වන්නෙකු ලෙස දිස්වන නමුදු 2004 වසරේ සිට ඔහු යුරෝපීය බලවතුන්ගේ හා වොෂිංටනයේ කැමැත්ත දිනාගැනීමට ද ප්‍රයත්න දරා ඇත.

යුක්‍රේනයෙහි ''තැඹිලි සන්ධානයකට'' එක්සත් ජනපද අධිරාජ්‍යවාදය තවමත් කැමැත්ත දක්වන බවක් පෙනීයයි. බටහිර සමග සමීප සබඳතාවය වර්ධනය කරගැනීමට යුක්‍රේනයට අවශ්‍යනම් ''රඟපෑම් නවතා දැමිය යුතු'' බවට යුෂ්චෙන්කෝ සහ ටිමොෂෙන්කෝ යන දෙදෙනාට ම බිඩෙන් උපදෙස් දී ඇත. එසේ වුව ද යුෂ්චෙන්කෝ යුක්‍රේනය තුල දුර්වල පුද්ගලයෙකු ලෙස සලකනු ලබන්නා වූ ද, ක්‍රෙම්ලිනය තුල තියුනු විරෝධයට ලක්වන්නා වූ ද තත්ත්වයක් මත වොෂිංටනයේ සහාය ටිමොෂෙන්කෝ වෙත මාරු වීමට ඉඩ ඇත.

ජුලි 22 දින ජෝර්ජියාවට පැමිනි බිඩෙන් ජනාධිපති මිකේල් සකාෂ්විලි විසින් පිලිගන්නා ලදී. පසුගිය වසරේදී රුසියාවට එරෙහි ව්‍යසනකාරී යුද්ධයට අනතුරුව, ජෝර්ජියානු නායකයා දේශපාලන අර්බුදයකට මුහුන දී ඇත. කැඩී ගිය දකුනු ඔසෙටියා ප්‍රදේශයට ප්‍රහාරයක් එල්ල කරන ලෙස 2008 අගෝස්තුවේ දී සකාෂ්විලි නියෝග කලේ ය. 1990 ගනන්වල මුල සිට ම රුසියානු මිලිටරිය ඔසෙටියාව තුල දිගටම රැඳී සිටියේ ය.

ප්‍රහාරයට මොස්කව් තන්ත්‍රය ප්‍රතිචාරය දැක්වූයේ ජෝර්ජියාව ආක්‍රමනය කොට ඉන් පසුව ටිබිලිසියෙන් දකුනු ඔසෙටියාව හා තවත් රුසියාවට පක්ෂ ජෝර්ජියානු ප්‍රදේශයක් වූ අබ්කාසියාව ඒක පාර්ශිකව ස්වාධීනත්වය ප්‍රකාශ කිරීමට සහාය දැක්වීම තුලිනි.

විශේෂයෙන් 2003 වසරේදී එක්සත් ජනපදයෙහි සහාය ඇතිව සිදුවූ ''රෝස විප්ලවය'' තුලින් සකාෂ්විලි බලයට පත්වීමෙන් අනතුරුව, ජෝර්ජියානු මිලිටරියට සහාය දීමේ දී මුඛ්‍ය භූමිකාවක් එක්සත් ජනපදය ඉටු කලේ ය. එක්සත් ජනපද හමුදා සිය ගනනක් ජෝර්ජියානු හමුදාව තුල පැලපදියම් කර සිටින තත්ත්වයක් තුල, දකුනු ඔසෙටියාවට පසුගිය වසරේ එල්ල කරන ලද ප්‍රහාරය සම්බන්ධයෙන් වොෂිංටනය කල්තියා දැන සිටින්නට ඇත.

ඔසෙටියාවෙහි සිය මිලිටරි වික්‍රමයට වොෂිංටනයේ ආධාර ලැබෙනු ඇතැයි ජෝර්ජියානු ජනාධිපති පැහැදිලිව ම විශ්වාස කලේ ය. එසේ වුව ද, එක්සත් ජනපද හමුදා ඍජුවම මැදිහත් වී නම්, ක්‍රෙම්ලිනයේ ප්‍රතිචාරයෙහි පරිමානය බලවතුන් දෙදෙනා අතර විවෘත යුද්ධයක් ඇවිලීමේ තර්ජනය එල්ල කලේ ය. එක්සත් ජනපදය, මෙම ප්‍රදේශයට නාවික යාත්‍රා පිටත්කර යවා රුසියානු ''ආක්‍රමනයට'' එරෙහිව අනතුරු ඇඟවීය. එනමුදු, අවසනදී සකාෂ්විලිට හා වොෂිංටනයට යුද්ධය හිසරදයක් බවට පත්විය.

මෙම ගැටලුවෙහි ප්‍රතිඵලයක් වශයෙන් දකුනු ඔසෙටියාව හා අබ්කාසියාව රුසියාවේ කක්ෂය වෙතට වඩාත් සමීප කල අතර වෙන්වීමට නැඹුරු වී සිටින ප්‍රදේශ දෙක තුල රුසියානු හමුදා රැඳවීම වඩාත් ශක්තිමත් වී තිබේ. සකාෂ්විලිට ඉල්ලා අස්වන ලෙසත් 2013 වසරේදී පැවැත්වීමට නියමිත ජනාධිපති මැතිවරනය කලින් පවත්වන ලෙසත් ඉල්ලා ටිබිලිසියෙහි නිතර පැනනගින මහා පරිමානයේ විරෝධතාවලට ඔහු මුහුන දී සිටියි. පසුගිය වසරේ පැවති යුද්ධයෙහිදී දූෂනය හා අදක්ෂකම පිලිබඳව විරුද්ධපාක්ෂික කන්ඩායම් ජනාධිපතිට චෝදනා එල්ල කර ඇත.

බිඩෙන් පැමිනීමට දින කිහිපයකට ප්‍රථම ජනාධිපති ධූරයෙහි බලතල සීමා කිරීමටත් කලින් ප්‍රාදේශීය මැතිවරන පැවැත්වීමටත් නීති සම්පාදනය කරන බවට විපක්ෂයට අපැහැදිලි පොරොන්දු දීමටත් සකාෂ්විලිට සිදුවිය. ඉල්ලා අස්වන ලෙස සකාෂ්විලිට කරන බලපෑම් මගහැරීම සඳහා සකාෂ්වලි හිතාමතාම ගෑසූ ''මහජන සබඳතා කරනමක්'' ලෙස හඳුන්වමින් විපක්ෂ නායක ඩේවිඩ් බර්ඩ්සෙනිෂ්විලි එම යෝජනාව

ප්‍රතික්ෂේප කල අතර විරසකය පාගා දැමීම සඳහා ජනාධිපති සිය බලය යෙදීමට සැලසුම් කරන බව ද ඔහු පැවසීය.

දකුනු ඔසෙටියාව හා අබ්කාසියාව වෙන්වී යාමේ වත්මන් තත්ත්වය රුසියාව විසින් පිලිගැනීමට එකට එක කිරීමක් වශයෙන් ජෝර්ජියාවෙහි දී පවත්වන ලද කථාවක දී බිඩෙන් ජෝර්ජියාවේ භෞමික අඛන්ඩතාවට සහාය දැක්වීය. එසේ වුව ද සකාෂ්විලි පිලිබඳ තරමක විවෘත විවේචනයක යෙදෙමින්, බටහිර රටවලට වඩා සමීපවීමට මත්තෙන් ජෝර්ජියාව ප්‍රතිසංස්කරන ක්‍රියාත්මක කල යුතු බව ඔහු කියා සිටියේ ය. ජෝර්ජියාව, නේටෝ සංවිධානයට එක්වීම පිලිබඳ සැලසුම් පසෙක තබා ඇතැයි තානාපතිවරු රහසිගතව වාර්තා කරත්.

දකුනු ඔසෙටියා හා අබ්කාසියා මායිම් ඔස්සේ රුසියානු හමුදා මෙහෙයුම් නිරීක්ෂනය කිරීම සඳහා නිරීක්ෂකයන් එවන ලෙස සකාෂ්විලි එක්සත් ජනපදයෙන් ඉල්ලා සිටි නමුත් මේ අවස්ථාවෙහි දී වොෂිංටනය එවැනි පියවරකට එකගවීම අපේක්ෂා කල නොහැක.

ජෝර්ජියාව පිලිබඳව මොස්කව් හා වොෂිංටනය අතර ඇති කර ගත් නව ගනුදෙනුවක ඉඟියක් පලකරමින් ජෝර්ජියාවෙහි මීලග ඇමරිකානු තානපති වශයෙන් ඔබාමා මෑතක දී ජෝන් බාස් නම් කලේ ය. බාස් මෑතක දී බැග්ඩෑඩ්හි එක්සත් ජනපද තානාපති කාර්යාලයෙහි සේවය කල අතර නේටෝ සංවිධානය හා රුසියාව අතර සබඳතා වර්ධනය කිරීමෙහි ලා රාජ්‍ය දෙපාර්තමේන්තුව තුල වෙසෙසියාවක් ඇති කර ගත් අයෙකි. කලාපීය වශයෙන් ජෝර්ජියාව සමීප සගයකු ලෙස නගා සිටුවීමේ එක්සත් ජනපද ප්‍රයත්නය එසේ පවත්වාගන යන අතර මෙම පත්වීම වොෂිංටනය හා රුසියාව අතර ආතතීන් සැහැල්ලු කරලීමේ පියවරක් ලෙස දිස්වේ.

ජනතාව අතර ඉමහත්සේ අපකීර්තියට පත් මානව අයිතීන් උල්ලංඝනය කිරීම්, සදාචාරාත්මක වංචාව හා වංචා සහගත ලෙස අධිකරනය හසුරුවීම පිලිබඳ චෝදනාවලට මුහුන දෙන සකාෂ්විලිගේ ආන්ඩුව ඒ අතරවාරයේ ඔබාමා පාලන තන්ත්‍රය විසින් වර්ග කරනුයේ ප්‍රජාතන්ත්‍රීය මිත්‍රපාක්ෂිකයෙකු ලෙස ය. එසේ වුව ද, එක්සත් ජනපද මූලෝපායික අවශ්‍යතාවන් සඳහා වඩාත් විශ්වාස දායක අවියක් බවට සකාෂ්විලි පත් නොවුව හොත් වර්මාන පාලන තන්ත්‍රයෙහි ආයු කාලය සීමිත වීමට ඉඩ ඇත.

ජෝර්ජියාව වූකලි කැස්පියානු මුහුදෙහි ඛනිජ තෙල් හා ගෑස් ප්‍රවාහන මාර්ගයේ පිහිටි මධ්‍යස්ථානයකි. රුසියාව මගහැර යමින් ජෝර්ජියාව හා කොකේසස් රටවල් හරහා අමතර විකල්ප නල මාර්ග වර්ධනය කර ගැනීමට වොෂිංටනය හා යුරෝපා සංගමය උත්සුක වන අතර ටිබිලිසියේ අස්ථායී පාලන තන්ත්‍රයක් නිසා ජෝර්ජියාව හා කලාපය තුල සිය ලාභාපේක්ෂාවන් තර්ජනයට ලක්වනු දැකීමට බටහිර බලවතුන්ගේ කැමැත්තක් නැත.

බිඩෙන් සංචාරය සම්බන්ධයෙන් ප්‍රන්ස 24 නැමැති රූපවාහිනී නාලිකාවට සිය අදහස් දක්වමින් කොකේසියානු මධ්‍යම යුරෝපීය හා රුසියානු සබඳතා අධ්‍යයන කේන්ද්‍රයෙහි ජෝර්ජ් ෆෙඩ්රික් ඩිව්ස්බරි ප්‍රකාශ කර සිටියේ වොෂිංටනය දැනටමත් ජෝර්ජියාවෙහි ''ඊලග පරම්පරාවේ නායකයින්'' සොයා යාමේ කාර්යයෙහි නිරතවී සිටින බවයි.

මාර්තු මස අත්සන් තබන ලද සකාෂ්විලි-විරෝධී එකමුතුවේ ප්‍රකාශනයක් යටතේ සහයෝගිතාවෙන් කටයුතු කරන ප්‍රධාන විරුද්ධ පක්ෂ ද මේ රට කොකේසස් කලාපයෙහි එක්සත් ජනපද අධිරාජ්‍යවාදය වෙනුවෙන් කූටියක් වශයෙන් පිලිගැන්වීමට එකහා සමානව කැපවී සිටී. සිය සංචාරය තුල දී බිඩෙන් විරුද්ධ පක්ෂ නායකයින් ද හමුවිය.

මහජනයා අතර අපකීර්තියට පත් ජෝර්ජියාවෙහි හා යුක්‍රේනයෙහි නායකයින්ට ඉල්ලා අස් වීමට බිඩෙන් බලකරනු ඇතැයි කොමර්සාන්ට් නමැති රුසියානු පුවත්පත මේ සතියේ වාර්තා කලේ ය. මෙම ප්‍රවාදය ක්‍රෙම්ලිනය විසින් රෝපනය කරන ලද්දක් වීමට ඉඩ ඇති වුව ද පූර්ව සෝවියට් කලාපයක් වූ මෙහි වර්තමාන එක්සත් ජනපද ආසක්තයන් වෙනුවෙන් පෙනී සිටීමේ දී නායකයින් දෙදෙනාම බොහෝ සෙයින් වැනෙනසුලු පුද්ගලයන්ය යන අදහසෙහි යම් ප්‍රමානයක සත්‍යයක් ගැබ්ව ඇත.

පසුගිය වසරෙහි රුසියාව සමග සිදුවූ සකාෂ්විලිගේ යුද්ධයේදී ද නේටෝ සංවිධානය හා ගෑස් සැපයුම් පිලිබඳ ක්‍රෙම්ලිනය සමග යුෂ්චෙන්කෝ ඇති කරගත් ආරවුල් සම්බන්ධයෙන් ද එවක දී එක්සත් ජනපදයෙහි සහාය ලැබුන ද, දැන් ඔබාමා පාලන තන්ත්‍රය යටතේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ කේන්ද්‍රීය අවධානය ඉවතට හරවන ඒවා බවට පත්ව තිබේ. එක්සත් ජනපදයේ මූලික අවධානය දැන් යොමුව ඇත්තේ ඇෆ්ගනිස්තානයේ එක්සත් ජනපද මිලිටරි වාඩිලෑම හා පකිස්තානය එහි විශ්වාසනීය සේවා දායකයෙකු වශයෙන් ආරක්ෂා කර ගැනීම කෙරෙහිය. මේ සඳහා දැනට තමන්ට මොස්කව් තන්ත්‍රයෙහි ආධාරය අවශ්‍යය යන නිගමනයට වොෂිංටනය පැමින ඇත.

© www.wsws.org